

## සුන්දර වූ රාත්‍රිය

හෙමින් හෙමින් හඳහාමී එබී බලන වා
හඳහාමිගෙ රන්එළියෙන් ලෝ නැහැවෙනවා
කඩුපුල් සේපාලික මල් පිපී නටන වා
මඳ සුළඟෙන් ලෝ තලයම සුවෙන් නිදනවා

උඳුපියලිය කොළ දිලිසෙයි පිනි බින්දු වැටී
හා පැටවුන් පිඹුම් ගසයි එහි රසය දැනී
නිතර නිදන බකුසු හාමි එයි නැගිට යළී
හ්ම් හ්ම් හ්ම් කියා ගී කියයි යළී


තරු කුමරියො හඳ වටේට රංචුගැහෙන වා
සිහින් සිහින් සිහින් හඬින් ගී මුමුණන වා
ඒ තාලෙට අතුඉති පොඩි අත්වැල් දෙන වා
ඊකාලය තාමත් මට මැවී පෙනෙන වා

♦ **සුවිමාලි ජයසිංහ**
**සිරිමා බණ්ඩාරනායක බාලිකා විද්‍යාලය**
**කොළඹ 7 Sri Lanka**


## සිහිනය

කුරුලු පිහාටුවක නැගී
අහසේ පාවී ගියා තනිව
එහි අරුම ලෝකයකි
නිහඬයි අලංකාරයි
හදට එබිකම් කර
තාරකාවක් අරන් පියාඹා
දුහුළු වලාවෙහි සැතපුනා
හද තිගැස්සුණා
නෙත් ඇහැ ඇරුණා
වැටහුණා සැම වැටහුණා
සැබෑ ලොවට මා පැමිණියා

**අනුරුද්ධිකා ලක්මාලි**
**සංඝබෝධි විදුහල මිනිපෙ**
**Sri Lanka**




## Ice Cream අයිස් ක්‍රීම්



The history of ice cream can be traced back to the fourth century BC. Emperor Nero in the first century AD refers to it in his writings, but it really took off in China in the court of Tang in the seventh century. Sailors brought it to Europe and, in 1848 in the US; William Young patented the hand-cranked freezer, a process still used today.

**අ**යිස්ක්‍රීම් ඉතිහාසය ක්‍රි පූ 4 වන සියවස දක්වා දිව යයි. රෝම අධිරාජ නීරෝ 1වන ශතවර්ෂයේ සිය ලියවිලි වල අයිස්ක්‍රීම් ගැන සඳහන්කර ඇත. එය සැබැවින්ම ප්‍රසිද්ධියට පැමිණියේ 7 වන සිය වසේ චීනයේ ටැන් රජවාස ලෙහිය. නාවිකයෝ එය යුරෝපයට රැගෙන ආහ. 1848 දී ඇමරිකාවේ විලියම් යන්ග් අයිස් ක්‍රීම් හදන අතින් කරකවන ශීතකරණය සෑදීය. අදත් භාවිතා වනුයේ ඒ ක්‍රමයමය.

♦ ***Auntie Ramani* - රමණී නැන්දා**

## මගේ මල් වත්ත

මගෙ මල් වත්තේ
මල් පිපී ඇත්තේ
සමනලයන් ඉගිලි ඉගිලි
මල් පැණි බොන්නේ

මල් සුවඳ හමන්නේ
තව මල් පිපී ඇත්තේ
සමනලයන් පාට පාට
මල් වෙත ඉගිලේ

අන්න අනන්න රෝස ගහේ
කැකුළු ද ඇත්තේ
මී මැස්සන් රූංගාමින්
ඉගිලී යන්නේ



♦ **වාසනා මධුෂානි**
**සුජාතා බාලිකා විදුහල**
**ගලගෙදර Sri Lanka**

BOC
ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි
ලංකා බැංකුව
BANK OF CEYLON
ලන්ඩන් ශාඛාව




No 1, Devonshire Square, London EC2M 4WD
Phone : 020 7377 1888 Fax: 020 7377 5430
e-mail : bankofceylon.uk@btclick.com
Our Web - www.boc.lk
Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit



## අවමංගල්‍ය
## ප්‍රේමා අදිකාරි මහත්මිය

**පො**ල්ගහවෙල නව කොළඹ පාරේ විසූ විශ්‍රාමලත් අධ්‍යාපන නිලධාරි පර්සි වීරසූරිය මහතාගේ ආදරණීය භාර්‍යාව වූ, පරාක්‍රම (USA), ලක්ෂමන් (UK), ප්‍රියංකා (USA), දමිත (UK), තමර (Yemen), දිලානි (UK) ගේ මෑණියන්වූ ද, චාමිනී (USA), හිරෝමි (UK), මිකී (USA) රේට් (UK), ලංකා (UK), ශංඛ (UK) ගේ නැන්දනිය වූ ද විශ්‍රාමලත් විදුහල්පතිනි ප්‍රේමා අදිකාරි මහත්මිය අවුරුදු **80** ක් ආයුවළඳා අභාව ප්‍රාප්ත වූවාය.

අවසන් කටයුතු **2009** අගෝස්තු **17** වන සඳුදා සවස **3** ට **North East Surrey Crematorium, Lower Morden Lane, Morden, Surrey SM4 4NU** හිදී සිදුකෙරෙන බැව් සංවේගයෙන් දූදරු පිරිස දැනුම් දෙති.

**ද**යාබර මවක්, ගුරුවරියක්, විදුහල් පතිනියක්, මෙන්ම කිවිඳියක්ද වූ ප්‍රේමා අදිකාරි මහත්මියගේ වියෝගය සැබැවින්ම අප දැඩි සංවේගයට පත් කළේය. කරුණාවෙන්, මුදු වදනින්, පියකරු සිනහවෙන් හා සිත් පහදන පෙනුමෙන් යුතු ඇය වන් අය අප සමාජයේ සැබැවින්ම දුර්ලභ ය.

ප්‍රේමා අදිකාරි මහත්මිය ගුරුවරියක ලෙස පොල්ගහවෙළ, නාරම්මල, පින්නවල යන මධ්‍ය මහා විද්‍යාලයන්හිද, පොල්ගහවෙල ශාන්ත බර්නදෙත් විදුහලේද සේවයකළ අතර, ඇපාකන්ද බුවනෙකබාහු විදුහලේ විදුහල්පතිනිය වශයෙන් කටයුතුකර සේවයෙන් විශ්‍රාම ලැබුවා ය.

අදිකාරි මහත්මිය ලංකාවිත්ති පුවත් පතට අතිශය හිතවත්ව සිටි පාඨකයෙකු වූවා පමණක් නොව පත්‍රයට නිතර කවි පන්තිද රචනා කළාය. ඇය ඒ පද්‍යයන් ගෙතූයේ මාතෘ භූමියට ඇයගේ ඇති ආදරය හා භක්තියද, හැදෙන වැඩෙන සිංහළ දරුවන්ට ඔවදන්ද තේමාවට ගනිමිනි. ඇයගේ අවසන් කවි පෙළ ලියැවී තිබුණේ ශ්‍රී ලංකාවේ රණවිරුවන්ට උපහාර දැක්වීම පිණිස ය.

සති දෙකකට පෙර මම ඇය බලන්නට ගියෙමි. කථා කළ නොහැකි ආබාධයෙන් පෙළුණ නමුත් ඒ සුපසන් සිනාවේ අඩුවක් නොවීය. පුවරුවක පැන්සලෙන් යමක් ලියා ඇය මට පෙන්වූවාය. ඒ මා ගැන ලියූ කවියකි. අදිකාරි මහත්මියගේ දරුවන් සියළුදෙන හා සොහොයුරාද එදින ලන්ඩනයේ ඇය වටා සිටි දිනයකි. එදා ඒ මුහුණ ආලෝකයෙන් බබළනු මම දුටුවෙමි. අවසන ඇයට දීර්ඝායු පතා මා නික්මුණේ නැවත ළඟදී බලන්නට එන බව කියමිනි.

ප්‍රේමා අදිකාරි මහත්මිය ආගම දහමට අතිශය ලැදි කාන්තාවකි. ධර්මය පිළිබඳ පොත්පත් කියවූවාය. භාවනා වැඩුවාය. අනිත්‍යය මෙනෙහි කළාය. එනිසා ඇයගේ සසර ගමන යහපත් වන බව නිසැකය.

**පින් කළ ඔබ නිබඳ ලැබූ සදහම් සෙවන**
**සන් සුන් සිතින් නික්මී ගිය බව දැනිණ**
**සුන් දර දෙසක ඉපදී බුදු බණ ඇසෙන**
**අන් තිම සැපත වේවා! සුපසන් නිවන**

**ප්‍රේමා අදිකාරි මහත්මියට**
**නිවන් සැප ලැබේවා!**

♦ දයා

There's a place in your heart
And I know that it is love
And this place could be much
Brighter than tomorrow
And if you really try
You'll find there's no need to cry
In this place you'll feel
There's no hurt or sorrow
There are ways to get there
If you care enough for the living
Make a little space
Make a better place...

Heal the world
Make it a better place
For you and for me
And the entire human race
There are people dying
If you care enough for the living
**Make a better place**
**For you and for me**
if you want to know why
There's a love that cannot lie
Love is strong it only cares for
Joyful giving if we try
We shall see in this bliss
We cannot feel fear or dread
We stop existing and start living

Then it feels that always
Love's enough for us growing
So make a better world
Make a better world...

And the dream we were conceived in
Will reveal a joyful face
And the world we once believed in
Will shine again in grace
Then why do we keep strangling life
Wound this earth…. crucify its soul
Though it's plain to see
This world is heavenly be god's glow
We could fly so high
Let our spirits never die
In my heart I feel
You are all my brothers
Create a world with no fear
Together we'll cry happy tears
See the nations turn their swords
Into plowshares….!



## Michael Jackson

**Make the world a better place for you and for me and the entire world**

**ලෝකය ඔබටත්, මටත්, සියළු ලෝකවාසීන්ටත් වඩා යහපත් තැනක් බවට පත් කරන්න!**

**ගා**යක සංගීතඥ මයිකල් ජැක්සන් ඉතා කණගාටුදායක ලෙස නොබෝදා මුළු ලෝකයක් හඬවමින් අකාලයේ මියගියේ ය. එහෙත් ඔහුගේ ගායනා මහිමය, ගැයූ ලියූ ගීත හා සංගීතය තව බොහෝ කාලයක් සංගීතකාමී ලෝක ජනතාව අතරේ අනුස්මරණයව පවතිනවා නිසැක ය. **1991** දී සිය ගීත ඇල්බමයකට ඔහු විසින් පද ලියා තනු යොදා ගායනා කරනු ලැබූ හීල්ද වර්ල්ඩ් (ලෝකය සුවපත් කරන්න ) නම් ගීතය ඉතා ජනප්‍රිය වූවාසේම ලොව පුරා මිලියන ගණනක් ගී තැටි අළෙවි කෙරුණි. එසේම එම ගීය එක්සත් ජාතීන්ගේ ළමා සුබසාධන කාර්‍යයන් ප්‍රචාරය කිරීමට ද බෙහෙවින් ඉවහල් වීය.

එම ගීතය අප මෙහි පළකරන්නේ ඒ අමරණීය ගායකයාණන්ට පිදෙන උපහාරයක් ද වශයෙනි.